


මෙල්බන් නුවර අපගේ කලා පුරයක් වෙමින් පවතියි.

මේ අප කලාව පිළිබඳ ව ලියන ලිපි බොහොමයක් ඇරඹීමට යොදා ගන්නා සුපුරුදු පූර්විකාවකි. මෙහිදී අපගේ යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද? ශ්‍රී ලාංකික සම්භවයක් ඇතිව මෙරටට සංක්‍රමනය වූ අපි අපිමයි. අපගේ කලා පුරයක් යනු කවරෙක් ද? අප අතරේ සිටිනා දක්ෂ කලා හිතකාමීන්ගේ දේ වලින් යුත් නගරයකි. අදටත් මෙරට ප්‍රධාන ප්‍රවාහය හා මුහුවීම සිතලුවක් වී ඇති අප අපගේම දක්ෂයින්ගේ කුසලතා නැංවෙන නිර්මාණ වෙනුවෙන් මූලිකත්වය දිය යුතුය යන්න අවිවාදිතයි.

මව් රටේ සිටියදී අපි විදෙස් දේ අගය කළෙමු. ඒ දේ ම මෙහි ආ පසුත් සිදුවන බව පෙනේ. මෙය "ආනයනික මානසිකත්වය" නමින් අපි හඳුන්වමු. ජනප්‍රිය ප්‍රවීණයන්ගේ දේ අප වැළඳිය යුතු බව වෙනම ම කාරණාවකි. ඒවායින් ගුරුහරුකම් ලබා ගැනීමද අවශ්‍යමයි. මන්ද ප්‍රවීණයන්ගේ ඇසුරේ ලබා ගත හැකි දේ බොහෝ ඇති නිසාවෙනි. එහෙත් මේ වන විට ඇති වී තිබෙන ප්‍රවණතාවයට අනුව මෙහි වෙසෙන දක්ෂයින්ගේ යමක් එළි දැක්වීමට ඇති ඉඩ කඩ දිනෙන් දින සීමා වී යන්නකි. සියළු දේ වාණිජකරණයට නතු වෙමින් පවතිද්දී කලාව ඉන් මුදවා ගත නො හේ.

මේ දිගු පූර්විකාව ලිවීමට නිමිත්ත වූයේ පසුගිය ද නැරඹීමට ලැබුණ අපගේ දක්ෂයන් පිරිසකගේ අගනා නිර්මාණයකි. "ස්වාමි පුරුෂයින්ට පාසලක්" නම් වූ මෙම ප්‍රහසන වේදිකා නාට්‍යය "පර්ෆෝමිං ආර්ට්ස් සර්කල්" ( Performing Arts Circle) ඉදිරිපත් කිරීමකි. මොර්ලියර් ගේ "ද ස්කූල් ෆෝ හස්බන්ඩ්ස්" (The School For Husbands) ප්‍රහසනය (කෑදපෑාහ) පිරිවර්තනය කර ඇත්තේ අප අතර සිටිනා සෑම් වීරරත්න හිතවතා විසිනි. නාට්‍යයේ අධ්‍යක්ෂණය අප අතර සිටිනා ජය ශ්‍රී චන්ද්‍රජිත් ප්‍රවීණ රංගධරයාණන්ගේයි.



ප්‍රධාන චරිතය රඟ පෑ අශාන් ඩයස් මෑතක මෙරටට සංක්‍රමණය වූ මවුබිමේ දක්ෂ රංගන ශිල්පියෙකි. ඊට ම ගැලපීගෙන අපූරු රංගනයක යෙදුන ජගත් මුණසිංහ අප අතරේ ම කාලයක පටන් සිටිනා සහෘදයෙකි. එමෙන් ම ඊට එක් වූ අනෙක් ප්‍රධාන චරිතය රඟපෑවේ අප අතරේ සිටිනා මන්ජිත චන්ද්‍රජිත් යෞවනයායි. අප අතරේ වසනා සුලෝචනා විතානාරච්චි , ශිවන්ති නා-නායක්කාර, ගයනි මීමන ගේ, රයේෂ් ගුණසේකර, ප්‍රසන්න හේවගේ සහ අමිල වනසුන්දර එකි-නෙකාට නොදෙවෙනි වූත් පරස්පර වූත් රංග වින්‍යාසයන්ට අවතීර්ණ වූයේ ඒ ඒ චරිතවලට අනුවයි.



සිසිර දිසානායක

අප අතරේ වෙසෙන දේශාන් සී නොනිස් ගේ සංගීතයෙන්, අජිත් ද සිල්වාගේ අංග රචනයෙන් , ගයනි මීමන ගේ, ශිරන්තා ගෝමස්, දුමිඳු ගුණසේන හා ගාමිණී රණසිංහගේ වේදිකාලංක-රණයෙන්, මිලන්කා චන්ද්‍රජිත්ගේ නිෂ්පාදන කළමණාකරණයෙන්, උදය බණ්ඩාරගේ වේදිකා පරිපාලනයෙන්, අනුසුයා සුබසිංහගේ විදුලි ආලෝකකරණයෙන් මෙන් ම වරුණ සාවින්දගේ ප්‍රචාරක, මුද්‍රණ හා ග්‍රැෆික් නිර්මාණකරණයෙන් යුතුව වේදිකාගත වූ "ස්වාමි පුරුෂයින්ට පාසලක්" සැබැවින් ම ඉතා සාර්ථක අපේම නිර්මාණය කි. ඒ පිළිබඳව අවංකවම අපේ ප්‍රේක්ෂකයින් අතරේ සිටි අප හට සාඩම්බර විය හැකිය.

"ස්නාරලේ" ගේ චරිතයට පණ පෙවූ අශාන් ඩයස් යෞවන රංගනවේදියාගේ රංගනය ඇසි පියක් ගසන වේලාවකටවත් ඔහුගෙන් මිදීමට ප්‍රේක්ෂකයන්ට ඉඩ නොදුන් තරමේ ප්‍රබල රංගනයක් විය. අශාන් මව්බිමේ දී රඟපෑමෙහි යෙදුන තරුණයෙකු බව පසුව ඇසීමට ලැබිණ. ඔහු හා



සමව රඟපෑමට තිර රචනයේ ඉඩ ලද අනික් භූමිකාව වූ වැලරිගේ චරිතය රඟපෑවේ ජගත් මුණසිංහයි. විෂම චරිතයක භූමිකාව පණ ගැන් වූ අශාන් හට ප්‍රේමයෙන් බර එහෙත් ප්‍රහසනය කැටි කොටගත් චරිතයක භූමිකාව රඟපෑ ජගත් ගේ රංගන දයකත්වය නොමඳ ව ලැබිණ. ප්‍රහසනයත් , ප්‍රේමයත් සිය අභිනයන් සමඟ කලතා ජගත් කළ රංගනය සඳ මතකයේ රඳනා රංගනයකි. මේ සමගින් එකසේ මුහුවණ අනෙක් චරිතය වූයේ ඉසබෙලාගේ චරිතයි. ආලවන්ත , එහෙත් සටකපට , රූමත් යෞවන-යකගේ භූමිකාව රඟපෑ සුලෝචනා විතානාරච්චි යෞවනිය අතින් ඊට උපරිම සාධාරණය ඉෂ්ඨ වූ බව අපගේ හැඟීමයි. සුලෝච-නාගේ රංගනය තුලින්ද භූමිකාව අයැද සිටි ප්‍රහසනය මනාවට ලැබිණ.

මේ අතරේ සිටිනා බාලම රංගන ශිල්පියා ලෙස අපට හැඟෙනා මන්ජිත චන්ද්‍රජිත් යෞවනයා අන් සියළු භූමිකාවන්ට වඩා වැඩිමල් භූමිකාවට පණ පෙවීම ම අභියෝගයකි.

මන්ජිත එය අපූරුවට ජයගත්තේය. එමෙන්ම ලෙනෝ සහ ලිසේ ( ) චරිත රඟ දැක්වූ ශිවන්ති නානායක්කාර සහ ගයනි මීමන ගේ යෞවනියන්ද ඔවුන්ගේ උපරිම හැකියාවන් ප්‍රහසනය මුසුකොට ප්‍රදර්ශනය කළහ. වැලරිගේ චරිතය හා බද්ධ වූ අර්ගස්ට් චරිතය රයේෂ් ගුණසේකර ඉදිරිපත් කළේ ද සමස්ත නාට්‍යයේම මූලික රගපෑම් රටාව වූ ප්‍රහසනය මොනවට එළි දක්වමිනි. සුළු කාලයකදී පවා ප්‍රබල රංගනයකින් ප්‍රේක්ෂකයින්ට දැනෙන සේ මතක සටහන් තැබිය හැකි චරිත වෙයි. අර්ගස්ට් මෙන්ම , මහේස්ත්‍රාත් හා නොතාරිස් චරිත රඟ පෑ ප්‍රසන්න හේවගේත් ,අමිල වනසුන්දරත් ඒබ ව ඉතා හොඳින් වටහාගෙන ඉහළ රඟපෑම් ඉදිරිපත් කලහ.

ඈතක සිටිනා ප්‍රේක්ෂකයිනට වේදිකාවේ සිට අභිනයන් මෙන් ම හඬ විහිදුවාලීමට තරමක අධි රංගනයක හා උස් උච්චාරණයක යෙදිමට ශිල්පී න්ට සිදුවේ. ප්‍රේක්ෂකාගාරයක සිනා හඬ මධ්‍යයේ මේ විහිදූම් වඩාත් ඉහලින් කිරීම ප්‍රහසන නාට්‍යයක රඟපානා ශිල්පීන්ට මූණ පෑමට වන අභියෝගයකි. සියළු ශිල්පීන් ඒ කාරණා මැනවින් අවබෝධකරගෙන සිය රඟපෑම ඉදිරිපත් කළ බව අපට දැනෙන්නේ ඒ නො නැවතුන ප්‍රේක්ෂක සිනා හඬ මධ්‍යයේ වුව නාට්‍යය හොඳින් විඳගැනීමට ලැබුන නිසායි.

මෙවන් ප්‍රහසනයක් සඳහා ගෝචර වන නිර්මාණයක් තෝරා ගැනීමත්, එය පරිවර්තනය කිරීමත් පිළිබඳව මුලින්ම සෑම් වීරරත්න හිතවතාට ප්‍රශංසා කළ යුතුයි. මුළු නාට්‍ය පුරාම වූ රංගන වින්‍යාස පුරුදු පුහුණු කර , හැකියාවන් වඩවා උපදෙස් දෙමින් සිය කාලය, ශ්‍රමය, දැණුම, ශිල්පීය ක්‍රම දායක කළ ජය ශ්‍රී චන්ද්‍රජිත් රංගධරයාණන්ට ද අපගේ ප්‍රසංශාව මෙන්ම තුතිය පිරිනැමෙයි.

A WINNER IS A DREAMER WHO NEVER GIVES UP
- Nelson Mandela

විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com

